# 11 යුරෝපයේ නව දේශපාලන චින්තනයේ වර්ධනය

**මෙම ඒකකයෙන් නූතන යුගයේ යුරෝපයේ ඇති වූ මානව වාදය, ජාතිකවාදය, ලිබරල්වාදය, සමාජවාදය වැනි විවිධ සංකල්ප පිළිබඳවත්, ඒවා ප්‍රායෝගික ව දක්නට ලැබුණ ප්‍රංශ විප්ලවය, ඉතාලි එක්සත් කිරීමේ හා ජර්මන් එක්සත් කිරීමේ ව්‍යාපාර පිළිබඳවත්, රුසියානු විප්ලවය පිළිබඳවත් තොරතුරු අධ්‍යයනය කළ හැකි ය.**

## මානවවාදය යනු කුමක් ද?

යුරෝපයේ වරින්වර විවිධ මතවාද පැනනැගුණි, උදහරණ වශයෙන් වැඩි ම ප්‍රයෝජනවත් දෑ උසස් ලෙස, කලක දී සලකන ලදී. එය **උපයෝගීතාවාදයයි.** කාලයක දී සියල්ලට ම වඩා මුදල් වැදගත් කොට සලකන ලදි. එය **වාණිජවාදයයි.** මේ සියල්ල යටපත් කරමින් සියල්ලට ම වඩා මිනිසා වැදගත් ය යන සංකල්පය බිහි විය. එය **මානවවාදය** වේ. වැඩවසම් යුගය අවසානයේ මිනිසා මිනිසා ව උසස් කොට සලකන්නට හුරුවීම නිසා මානවවාදය ඉස්මතු විය. මෙය වර්තමානය දක්වා පිළිගනු ලබන මතවාදයයි. ප්‍රංශ විප්ලවය මානවවාදය ඉස්මතු කළ වැදගත් අවස්ථාවක් වූ අතර මානව හිමිකම් ආරක්ෂා කිරීමට වත්මන් ලෝක ප්‍රජාව යොමු ව ඇත්තේ මානවවාදී සංකල්පය ලොව පුරා ව්‍යාප්ත වීම නිසාය.

ගෞතම බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම් අනුව සහ හින්දු ක්‍රිස්තියානි ඉස්ලාම් වැනි ලොව ප්‍රධාන ආගම්වල ද මිනිසාට ප්‍රමුඛත්වයක් ලබා දී ඇති අතර මෙම පැරණි සංකල්පවල පුනරාගමනයක් ලෙස යුරෝපයේ ඇති වූ මානවවාදී සංකල්පය හැඳින්විය හැකි ය.

### ප්‍රංශ විප්ලවය - 1789

නිදහස, සමානාත්මතාව සහ සහෝදරත්වය යන තේමා පදනම් කර මිනිසා උතුම් කොට සැලකිය යුතු ය යන මානවවාදී අදහසින් ප්‍රංශ විප්ලවය ආරම්භ විය.

ක්‍රි.ව. 1789 දී ප්‍රංශය පාලනය කළ දහසයවන ලුවී රජුගේ පාලනයට එරෙහි ව ප්‍රංශයේ ඇති වූ දේශපාලන පෙරළිය ප්‍රංශ විප්ලවය නමින් හැඳින්වේ. මෙහි විශේෂත්වය වන්නේ විප්ලවයට බලපෑ දේශපාලන කරුණු ඔහුගේ පුරෝගාමීන් වූ දහහතර වන ලුවී හා පහළොස්වන ලුවී යන පාලකයින්ගේ කාලවල සිට වර්ධනය වී ආ ඒවා වීම ය.

### දේශපාලන හේතු

ප්‍රංශයේ සෙසු යුරෝපා රටවල මෙන් දේශපාලන ප්‍රතිසංස්කරණ සිදු නො වී ය. උදා : එංගලන්තයේ පාර්ලිමේන්තු ක්‍රමයක් බිහි වූ අතර ප්‍රංශයේ දිගට ම රාජාණ්ඩුව පැවතුණි.

දහහතරවන ලුවී රජතුමා දක්ෂ පාලකයකු වූ නිසා අසීමිත ඒකාධිපතිත්වයක් ඔහු වටා සංකේන්ද්‍රණය විය. ඔහු ප්‍රකාශ කළේ "රාජ්‍ය නම් මමය" යනුවෙනි.

උදා: රජුගේ රාජසභාව හෙවත් උපදේශක මණ්ඩලයට ඇමතිවරුන්. විනිශ්චයකාරවරුන්, තානාපතිවරුන් ආදී උසස් නිලධාරීන් පත්කිරීම් හා ඉවත් කිරීමේ බලය රජු විසින් තමා යටතට ගන්නා ලදී.

පහළොස්වන ලුවී රජු ද දහසයවන ලුවී රජු ද එලෙස බලතල තබා ගැනීමට උත්සාහ ගන්නා ලදී. එහෙත් පහළ මට්ටමේ නිලධාරීහු රජුට පක්ෂපාතී නොවූහ.

ප්‍රංශ රාජාණ්ඩුව ක්‍රමයෙන් ඒකාධිපති ස්වරූපයක් ගත් අතර අතීතයේ සිට පැවති මහජන නියෝජිත ආයතනයක් වූ ස්ටේට් ජනරාල් සභාව නොසලකා හැර තිබීම තවත් හේතුවකි. එම සභාව සමන්විත වූයේ පූජක රදල සහ සාමාන්‍ය ජනතාවගෙනි. එය කෙතරම් නොසලකා හරින ලද්දක් ද යත් ක්‍රිව. 1614න් පසු රැස් වී නැත.

රාජාණ්ඩුවට බලය සංකේන්ද්‍රගත වීම නිසා පළාත් පාලන ආයතන කටයුතු ප්‍රමාද විය. මේනිසා අකාර්යක්ෂම පරිපාලනයක් බිහිවීම ප්‍රංශ විප්ලවයට බලපෑ හේතුවකි.

ප්‍රංශයේ අධිකරණ කටයුතුවල ද ව්‍යාකූලත්වයක් පැවතුණි. එක් එක් ප්‍රදේශවලට වෙන්වූ සුවිශේෂ වූ නීති ක්‍රම 360ක් පමණ තිබුණි. තව ද රජුට ඕනෑ ම විටක ඕනෑ ම අයෙකුට එරෙහි ව වරෙන්තු නිකුත් කිරීමට හැකිවීම හා බන්ධනාගාරගත කිරීමට හැකියාව තිබුණි. ඒ සඳහා යොදා ගත්තේ බැස්ටිලය නම් හිර ගෙදරයි. ඒකාධිපතිවාදයේ සංකේතයක් ලෙස සැලකෙන බැස්ටිල් හිර කඳවුරට පහර දී සිරකරුවන් නිදහස් කරගන්නා ලදි. එය ප්‍රංශ විප්ලවයේ ආරම්භය ලෙස සැලකේ.



11.1 රූපය 14 වන ලුවී රජු



11.2 රූපය - බැස්ටිල් හිරගෙදර

දහසයවන ලුවී රජ දවස වන විට ප්‍රංශ ආර්ථිකයේ පැවැති බංකොලොත්භාවය ද විප්ලවයට හේතු විය. දහහතරවන ලුවී රජුගේ කාලයේ සිට විදේශ යුද්ධවලට ප්‍රංශය විශාල ලෙස මුදල් වැය කර තිබුණි. මේ නිසා දහසයවන ලුවී රජුගේ කාලය වන විට ප්‍රංශය අධික ණය බරින් යුතු විය.

ප්‍රංශයේ දහහතරවන ලුවී රජ ඉතා කායශූර සෑම දෙයක් පිළිබඳ ව නිරතුරු ව සොයා බැලූ පාලකයෙකි. එහෙත් දහසයවන ලුවී රජ තම රාජ්‍ය කාලය තුළ කිසිවක් සොයා බැලීමට උනන්දු නොවූ කුසීත පාලකයෙකි. මෙය ද ප්‍රංශ විප්ලවයට බලපෑවේ ය. මේ නිසා පාලකයන් හා සාමාන්‍ය ජනතාව අතර සබඳතා දුරස් විය.

රජුගේ උපදේශකයා වූයේ 74 හැවිරිදි මොරිපා නම් නවීන අදහස්වලින් තොර වූ අයෙකි. ඒ වන විට වයෝවෘද්ධ ව සිටි මෙතුමා අලුත් නිලයේ වරප්‍රසාද භුක්ති වින්ද විනා ප්‍රධාන ප්‍රතිසංස්කරණ කිසිවක් සිදු නොකළේ ය. ටර්ගෝ සහ නෙකර් වැනි දක්ෂ ඇමතිවරුන් පරිපාලන ප්‍රතිසංස්කරණ ඉදිරිපත් කළ විට රජු ඔවුන් ව සේවයෙන් පහ කළේ ය.

දහසයවන ලුවී රජුගේ බිසව වූයේ ඔස්ට්‍රියානු ජාතික මාරි ඇන්ටොයිනට් රැජිනයි. ඇය විදේශ කාන්තාවක වූ බැවින් ප්‍රංශ දේශපාලනය පිළිබඳ අවබෝධයක් නොවූ අතර අනවශ්‍ය ලෙස ප්‍රංශයේ පාලනයට මැදිහත්වීම නිසා ද ජනතාව ඇය කෙරෙහි කලකිරී සිටියේය.

## ආර්ථික හේතු

1. ප්‍රංශයේ වරප්‍රසාදලත් වංශාධිපතිවරුන් සහ ඉහළ ස්තරවල සිටි සුළු කොටසක් වූ වරප්‍රසාදලත් පූජකවරුන් බදු ගෙවීමෙන් නිදහස් විය. වංශාධිපතිවරුන් සහ කිතුනු සභාව සතු ඉඩම්වල වාසය කළ ගොවීන්ට, ප්‍රවේණි බදු ඇතුළු විවිධ බදු වර්ග විශාල වශයෙන් ගෙවීමට සිදුවිය. ග්‍රාමීය ප්‍රදේශවලින් අය කළ ටේලි නම් බද්ද ප්‍රධාන නගරවලින් අය නො කෙරුණි. ලුණුවලින් අය කළ ගැබේල් බද්ද නිසා ද ජනතාව පීඩනයට පත් විය. මේ අතර කැපිටේෂන් නම් නව බද්දක් සෑම අයෙකු ම ගෙවිය යුතු යැයි රජය නියම කළේ ය. භාණ්ඩ ප්‍රවාහනයේ දී එක ම භාණ්ඩයට ස්ථාන ගණනාවක දී බදු ගෙවීමට සිදු විය. ජලයේ ප්‍රවාහන කටයුතු වෙනුවෙන් ද වෙන ම බදු ගෙවිය යුතු විය. විප්ලවය ආරම්භවන විට සාමාන්‍ය ජනයා සිය ආදායමෙන් 50% - 60% අතර ප්‍රමාණයක් බදු ලෙස ගෙවීය.
2. යුරෝපයේ පුනරුදයත් සමග ම වෙළඳාමෙන් පොහොසත් වූ නව ධනවත් මධ්‍යම පංතියක් බිහි විය. ප්‍රංශයේ ද සිටි මේ මධ්‍යම පංතියට පාලන කටයුතුවලට සහභාගී වීමට හැකි නොවීය. මෙය ද විප්ලවයට හේතුවකි.
3. ක්‍රි.ව. 1786 දී එංගලන්තය සමග ඇති කරගත් ඊඩන් ගිවිසුම නිසා රෙදිපිළි ආනයනයේ දී තීරුබදු ඉවත් කෙරුණි. එංගලන්ත නිෂ්පාදන සඳහා යන්ත්‍ර භාවිතය නිසා එහි නිෂ්පාදන වියදම අඩුවීමෙන් ප්‍රංශ කුඩා කර්මාන්තවලට ඒ හා තරග කිරීම අපහසු විය. මේ නිසා ප්‍රංශ නිෂ්පාදන අඩාල විය.
4. විදේශ යුද්ධ නිසා මේ වන විට රාජ්‍ය භාණ්ඩාගාරය බංකොලොත් වීම විප්ලවයට බලපෑ තවත් හේතුවකි.

5. දුප්පත් පොහොසත් භාවය නිසා රදළයන් අතර ද ගැටුම් පැවතුණි.
6. ප්‍රංශ ජනතාවගෙන් 90%ක් ගොවීන් වූ අතර ඔවුහු රදලයන්ගේ ඉඩම් වගා කළ හ. රදලයාගේ මිදිමෝල තිරිඟු මෝල භාවිත කිරීම අනිවාර්ය වූ අතර ඒ වෙනුවෙන් බදු ගෙවිය යුතු විය. එමෙන් ම රදලයන් දඩ කෙළියේ යෙදෙන විට ගොවිතැන් කළ බිම් හරහා අසුන් පැදවීම නිසා වගාබිම් විනාශ වුව ද ඊට එරෙහි වීමට ජනතාවට අවස්ථාවක් නො වී ය.
7. රදලයන් ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරයෙහි යෙදීම නිසා ගොවීන්ට තම සතුන්ට අවශ්‍ය තෘණ භූමි අහිමි වීම ද එක් හේතුවකි.



11.3 රූපය - බදු බර පැනවීම

### වෙනත් හේතු

1. 18 වන සියවසේ ජීවත් වූ මොන්ටෙස්කියු, වෝල්ටෙයාර්, රූසෝ වැනි දර්ශනිකයන් ඉදිරිපත් කළ මානවවාදී අදහස් ප්‍රංශ විප්ලවයට බලපෑවේ ය.
2. බ්‍රිතන්‍ය තුළ තිබූ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ද ප්‍රංශ රාජාණ්ඩුව වැටීමට හේතු විය.
3. 1776 දී සිදු වූ ඇමරිකානු නිදහස් සටන ද මෙයට බලපෑවේ ය.

### විප්ලවය ආරම්භ වීම

වරප්‍රසාද අහිමි වූ පිරිස් ටෙනිස් පිටියකට රැස් ව තමන් ප්‍රංශයට නව ආණ්ඩුක්‍රමයක් හඳුන්වාදෙන බවට දිවුරුම් දුන්නේය. මෙය "ටෙනිස් පිටියේ දිවුරුම" නම් විය. ක්‍රි.ව. 1788 ස්ටේට් ජෙනරල් සභා නැවත රැස්වූ අතර එහි දී ද නව ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමට තීරණය විය. ක්‍රි.ව. 1789 ප්‍රංශ සාගතය නිසා මහජනයා වීදි බැස රජයට එරෙහි ව උද්ඝෝෂණ කළ අතර බැස්ටිල් සිරගෙය කඩා දමන ලදී. මෙය ප්‍රංශ විප්ලවයේ සංකේතයයි. ක්‍රි.ව. 1789 අගෝස්තු 29 දින මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශය එළි දැක්වින. "සියලු මිනිසුන් එක හා සමානය", ඔවුහු නීති සම්පාදනයට සහභාගි විය යුතු ය. අදහස් ප්‍රකාශ කිරීමට හා අයුක්තියට ඔවුන්ට අයිතියක් ඇත" යන්න එයින් ප්‍රකාශ විය. රදළ බලතල අහෝසි කෙරුණි. ඉහළ පන්තියේ පූජකවරුන් සතු ව පැවති බලතල අහෝසිකර සභාව කෙරෙහි ද නීති මාලාවක් පැනවී ය. ක්‍රි.ව. 1791 නව ව්‍යවස්ථාව පැනවූ අතර එමගින් නීති සම්පාදනයට 750කගේ සභාවක් පත්කර රජුගේ බලතල සීමා කරන ලදී. මහජනයා රජුගේ කැමැත්ත පරිදි සිරභාරයට ගත නොහැකි විය. ක්‍රි.ව. 1793 දී නඩු විභාගයකින් පසු දහසයවන ලුවී රජු හා මාරි ඇන්ටොයිනට් බිසව මරණ දඬුවමට යටත් කෙරිණ.

ප්‍රංශ විප්ලවය, වසර කිහිපයක් තුළ සිදු වූ ප්‍රතිසංස්කරණ මාලාවකි. ගුරුවරුන්, නීතිඥයින්, මහාචාර්යවරුන්, විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්, පූජකයින්, ගොවීන් එහි කොටස්කරුවන් විය. නිදහස, සමානාත්මතාව, සහෝදරත්වය, යන සංකල්ප ප්‍රංශය තුළත් ඉන් පිටතටත් මේ නිසා ව්‍යාප්ත විය. එය මිනිසාගේ අයිතිය රැකදුන් විප්ලවයක් විය.

**ක්‍රියාකාරකම්**

**1. ප්‍රංශ විප්ලවයෙන් මානව වාදය මතු වූ ආකාරය විස්තර කරන්න.**

### ජාතික වාදය

එනම් යම් භූගෝලීය පරිස්ථිතියක වෙසෙන සමාන ලක්ෂණවලින් හෙබි ජනතාවක් තම පොදු භාවය පදනම් කරගෙන එක ම පිරිසක් ලෙස තම අනන්‍යතාව ගොඩනගා ගැනීම යි. ජාතික වාදයට බොහෝ දුරට පදනම් වන්නේ භාෂාව, ජාතිය ආගම, සිරිත් විරිත්, උරුමය ආදියයි.

### ලිබරල් වාදය

ලිබරල්වාදය චින්තනයේ පදනම වන්නේ මහජන නියෝජිතයන්ගෙන් යුතු මණ්ඩලයක සහාය ඇති ව සකස් වූ ආණ්ඩු ක්‍රමයක් මගින් ජනතාවට සතුටුදායක පාලන ක්‍රමයක් ඇති කිරීම යි.

## ඉතාලිය එක්සත් කිරීමේ ව්‍යාපාරයේ ප්‍රධාන අවස්ථා :

## ඉතාලියේ විදේශ ආධිපත්‍ය




11.1 සිතියම - ඉතාලි එක්සත් ප්‍රදේශ

මධ්‍යතන යුගය වන විට ඉතාලිය පැවතියේ කුඩා රාජ්‍ය ගණනාවක් වශයෙනි. එම රාජ්‍යවල පාලකයන් අතර බල තරගයක් පැවතුණි. එසේ ම යුරෝපයේ බලවත් රටවල් ඉතාලි ප්‍රදේශ තම පාලනයට නතු කරගෙන සිටියේය. උදහරණ වශයෙන් සිසිලිය හා නේපල්ස් ස්පාඤ්ඤයට යටත් වීම දැක්විය හැක. පර්මා, මොඩිනා, ටස්කනි, වැනිසිය වැනි නගර ඔස්ට්‍රියාව යටතේත් මධ්‍යම ඉතාලි ප්‍රදේශ පාප්වහන්සේ යටතේත් තවත් ප්‍රදේශ වංශාධිපතිවරුන් යටතේත් පාලනය විය.

විදේශ ආධිපත්‍යය ද පාප් වහන්සේගේ රාජ්‍යය ද (ශුද්ධාසන රාජ්‍යය) ඉතාලිය එක්සත් කිරීමේ දී බාධාවක් ව පැවතුණි. ඔස්ට්‍රියාව සතු ව පැවති අධිරාජ්‍යය බලය අතිශය ශක්තිමත් වූ බැවින් එය පරාජය කිරීම ඉතා ම අසීරු බව පැහැදිලි ව පෙනුන අතර පාප්වහන්සේගේ දේශපාලන බලය හෙවත් ශුද්ධාසන රාජ්‍යය ඉවත් කිරීමට කටයුතු කිරීමේ දී යුරෝපයේ සෙසු කිතුනු රාජ්‍ය ඉතාලියට විරුද්ධ ව නැගී සිටීමට ඉඩ තිබුණි.

භේද භින්න ව සිටි ඉතාලි ජනතාව තුළ දේශමාමක අදහස් ඇති කර එක්සත් විය හැකි බව පෙන්වා දුන්නේ නැපෝලියන් බොනපාර්ට් ය. ජෝසප් මැසිනි එම කටයුත්ත කාර්යක්ෂම ව ඉදිරියට ගෙන ගිය අතර එම ව්‍යාපාරය සැලසුම් කළේ කවුන්ට් කැමිලෝ ය. ගැරිබෝල්ඩි ඒ සඳහා හමුද මෙහෙය වී ය.

## නැපෝලියන් යටතේ ඉතාලිය

නැපෝලියන් ක්‍රි.ව. 1797 වන විට උතුරු ඉතාලිය ලොම්බර්ඩ්වරුන්ගෙන් ලබාගත් ජිනෝවා, නේප්ල්ස්, ද අල්ලා ගත්තේ ඒවායේ පාලකයන් පලවා හරිමිනි. ක්‍රි.ව. 1807 දී පාප්තුමා යටතේ පැවති උතුරු ඉතාලි ප්‍රදේශ ද ලබාගෙන "උතුරු ඉතාලිය" නමින් රාජ්‍යයක් ආරම්භ කර තමා එහි රජු ලෙස ඔටුනු පැළඳ ගත්තේය. ඔහුගේ අගනුවර මිලාන් විය. පසු ව සිසිලි ප්‍රදේශය ද ඈඳ ගන්නා ලදී.

නැපෝලියන් බොනපාට් ඉතාලියට නැපෝලියානු නීති හඳුන්වා දුන් අතර වංශාධිපතිවරුන්ගේ බලතල අහෝසි කළේ ය. දක්ෂතාව ඇති අයට තනතුරු ලබා දුන් අතර මාර්ග සහ පාලම් ඉදි කළේ ය.

## වියානා සම්මුතියට පසු ඉතාලිය

නැපෝලියන් සිය යුද්ධ ව්‍යාපාරයෙන් පරාජය වීමත් සමග ක්‍රි.ව. 1815 වියානා සම්මුතිය මගින් ඉතාලි ප්‍රදේශ නැවත ක්‍රි.ව. 1798ට පෙර පාලනය කළ අයට ලබාදෙන ලදී. ඒ අනුව රෝමය මුල් කරගත් මධ්‍යම ඉතාලිය පාප්තුමාටත් සෙසු ප්‍රදේශ ඒ ඒ රටවලට හා රාජවංශයන්ටත් ලැබුණි.

මෙයින් පසු එනම් ක්‍රි.ව. 1815පසු ඔස්ට්‍රියාව, ස්පාඤ්ඤ ආදී රටවල් ඉතාලියෙන් ප්‍රයෝජන ගත්තේ ය. පාලකයන් ලෙස ඉතාලියේ ඉතිරි වූයේ පාප්තුමා සහ සාර්ඩිනියාවේ රජු පමණි. නැපෝලියන්ගේ වැන්දඹු බිසව වන මාරි ලුවී ආදිපාදවරිය යටතේ වූ ටස්කනි ප්‍රදේශයේ හොඳ පාලනයන් පැවතුණි. ඔස්ට්‍රියාව තම අධිරාජ්‍යයට අවශ්‍ය ආදයමෙන් 25% උපයා ගත්තේ ඉතාලි ප්‍රදේශවලිනි. පාලනය ගෙනයාමට දැඩි නීති හඳුන්වා දී ඇත. සාර්ඩිනියාවේ වික්ටර් එම්මානුවෙල් රජු ද ජනතාව පීඩනයට පත් කළ පාලකයෙකි.

## කාබොනාරී ව්‍යාපාරය

මේ කෘූර හා අයුක්ති සහගත පාලනයන් නිසා නැවත ඉතාලි ජනතාව තුළ ජාතික හැඟීම් උත්සන්න විය. ඔවුහු රහසේ ම එක්සත් වීමට කටයුතු කළ හ. ඒ සඳහා "කාබොනාරී ව්‍යාපාරය" නම් රහස් සංවිධානයක් බිහි විය. එහි නායකත්වය ජෝසප් මැසිනි විසින් දරන ලදි. "කළු කමිස හමුදව" නමින් ද මොවුන් හැඳින්විණ. ක්‍රි.ව. 1825 වන විට කාබොනාරීන් මැඩ පවත්වා මැසිනි ප්‍රංශයට පිටුවහල් කිරීමට ඔස්ට්‍රියානු අධිරාජයා සමත් විය.

## තරුණ ඉතාලි සංගමය

ක්‍රි.ව. 1830 නැවත ඉතාලිය එක්සත් කිරීමේ හඬ නැගී ආව ද එය පරාජය කරන ලදී. ක්‍රි.ව 1831 පීඩ්මොන්ට්හි බලයට පත් ඇල්බට් චාර්ල්ස් රජු එයට සහාය වෙතැයි මැසිනි විශ්වාස කළ නමුත් එවැන්නක් නොවූ නිසා "තරුණ ඉතාලි සංගමය" මෙහෙය වීය. "එක්සත්කම හා නිදහස" ඔවුන්ගේ තේමාව විය.



11.4 රූපය නැපෝලියන් බොනපාර්ට්

## කවුන්ට් කැවුවර්ගේ දායකත්වය

දක්ෂ සෙන්පතියෙකු වූ හෙතෙම එංගලන්ත පාර්ලිමේන්තුව අගය කළේය. ඔහු ක්‍රි.ව. 1852 දී ඉතාලියේ පීඩ්මොන්ට් රාජ්‍යයේ අගමැති ධූරයට පත් විය. "යළි ඉපදීම" නම් කෘතිය ලියා ඉතාලි ජනතාව අවදි කළ හෙතෙම පීඩ්මොන්ට් රාජ්‍යය තුළ නව ආණ්ඩුක්‍රමයක් ඇතිකර, පොදු පහසුකම් හා නිෂ්පාදනය වැඩි දියුණු කර පීඩ්මොන්ට් රාජ්‍යය ශක්තිමත් කළේ ඉතාලි එක්සත් ව්‍යාපාරයට නායකත්වය දීම සඳහා ය. ප්‍රංශය හා බ්‍රිතාන්‍ය හොඳහිත දිනගැනීමට ද හෙතෙම සමත් විය. එමෙන් ම තුන්වන නැපෝලියන් නම් ප්‍රංශ අධිරාජයා සමග ප්ලොම්බියස් නම් ගිවිසුමකට එළඹ ඕස්ට්‍රියාවට එරෙහි ව සාර්ථක සටනක් දියත් කිරීමට කවුන්ට් කැවුවර් සමත් වූ නමුත් තුන්වන නැපෝලියන් එකවර ම හමුදා ආධාර ඉවත් කර ගැනීම නිසා එම ප්‍රයත්නය අසාර්ථක විය. තුන්වන නැපෝලියන් එම සටන අත්හැරියේ ඔස්ට්‍රියාව සමග විලාප්‍රැන්කා ගිවිසුමට එළඹීම නිසාය.

## ගැරිබෝල්ඩිගේ මෙහෙයුම

සැවෝයිහි උපත ලද ගැරිබෝල්ඩි විදේශ ගරිල්ලා සටහන් මෙහෙය වූ නායකයකි. ඔහු ක්‍රි.ව. 1860 පසු සිය රතුකමිස හමුද භටයන් 1000ක පිරිසක් රැගෙන සිසිලියට ගොස් මෙසිනා නගරය හැර සෙසු ප්‍රදේශ අල්ලා ගත්තේ ය. පසු ව නේපල්සය සියතට ගත්තේ ය. ගැරිබෝල්ඩිගේ ජනප්‍රියත්වය නිසා මෙසිනා නගරය ද ඔහුට එක් විය. මේ ප්‍රදේශවල ජනාධිපති ධූරය ගැරිබෝල්ඩි දැරුව ද එම ප්‍රදේශ දෙවන වික්ටර් එම්මානුවෙල් රජුට පවරා දීමෙන් ඔහුගේ දේශමාමක පරිත්‍යාගශීලිබව පැහැදිලි වේ. වෙනීසිය ඔස්ට්‍රියාව යටතේ ද රෝමය පාප්තුමා යටතේ ද තිබීම ඉතාලි එක්සත් භාවයට හානිදයක විය. එනිසා ජර්මනියේ බිස්මාර්ක් සමග ගිවිසුමක් ඇති කරගත් නිසා ගැරිබෝල්ඩි, ජර්මන්, ඔස්ට්‍රියන් යුද්ධයේ දී ජර්මනියට සහාය වී වෙනීසිය තමන් වෙත ලබා ගැනීමට කටයුතු කළේ ය. ක්‍රි.ව. 1870 දී ප්‍රංශය හා ජර්මනිය අතර යුදමය අවස්ථාවක් හටගත් නිසා රෝමයේ පාප්වහන්සේට ආධාර පිණිස නතර කර සිටි ප්‍රංශ හමුදා ආපසු ගෙන්වා ගැනීමට ප්‍රංශයට සිදුවිය. එහි ප්‍රතිඵලය වශයෙන් පාප්වහන්සේගේ රාජ්‍යය යුද්ධයකින් තොර ව ඉතාලියට අත්පත්කොට ගත හැකි බව පැහැදිලි වූයෙන් පාප්වහන්සේ තම කැමැත්තෙන් ම රෝමය අතහැර වතිකානුවේ සිය මාලිගයට සීමා විය.

යුරෝපා ඉතිහාසය හැඩගැස්වීමට විවිධාකාරයට දායක වෙමින් දීර්ඝ කාලයක් තිස්සේ පැවති පාප් රාජ්‍යය (ශුද්ධාසන රාජ්‍යය) එමගින් අවසන් වූ නමුත් පාප් වහන්සේගේ දේශපාලන බලය සංකේතවත් කිරීමට xi වන පියුස් පාප්වහන්සේ විසින් 1929 දී ඉතාලි ආඥාදායක මුසෝලිනී සමග ඇති කරගත් ගිවිසුමක් මත වර්ග සැතපුම් එකහමාරක් පමණ වන වත්මන් වතිකානු රාජ්‍යය පිහිටුවන ලදී. එය වර්තමාන ලෝකයේ පවතින සර්වාධිපති බලය සහිත කුඩා ම රාජ්‍යය වේ.

### ක්‍රියාකාරකම්

1. ඉතාලි එක්සත් කිරීමේ ව්‍යාපාරයේ ප්‍රධාන අවස්ථා සාකච්ඡා කරන්න.
2. මැසිනි, කැවුවර්, සහ ගැරිබෝල්ඩි යන අයගෙන් ඉතාලිය එක්සත් කිරීමේ ව්‍යාපාරයට සිදු වූ සේවය පිළිබඳ රචනයක් ලියන්න.
3. ඉතාලිය එක්සත් කිරීමෙ ව්‍යාපාරය පදනම් වූයේ ජාතික වාදය මතය රචනාවක් ලියන්න.

# ජර්මනිය එක්සත් කිරීමේ ව්‍යාපාරය

මෙහි දී අප ජර්මන් එක්සත් ව්‍යාපාරයේ ප්‍රධාන අවස්ථා ගැන විමසා බලමු. ක්‍රි.ව. 19වන සියවස ආරම්භ වන විට ජර්මනිය නමින් රටක් නොවූ අතර එම ප්‍රදේශවල ජර්මන් භාෂාව කතා කළ වැසියන්ගෙන් යුතු රාජ්‍යයන් 369ක් තිබුණි. ඒ අතර ප්‍රෂියාව හා ඔස්ට්‍රියාව වැදගත් වේ.

නැපෝලියන් අධිරාජයා ක්‍රි.ව. 1805 ඔස්ට්‍රියාවත් 1806 දී ප්‍රෂියාවත් පරාජය කර ජර්මන් ප්‍රදේශවල බලය ව්‍යාප්ත කළේ ය. එමෙන් ම එතෙක් නාමමාත්‍රික ව ජර්මන් ප්‍රදේශවල ක්‍රියාත්මක වූ ශුද්ධ රෝම අධිරාජ්‍යය අහෝසි කළ ඔහු ක්‍රි.ව. 1806 දී බැවේරියාව, වර්ටෙම්බර්ග්, බේමන්, ඩාර්ම්ස්ටාඩ්ට් සැක්සන් වැනි ප්‍රදේශ 12ක් එකතු කර රයින් සංයුක්තය ආරම්භ කළේ ය.

ඉන්පසු ව රයින් සංයුක්තයෙහි තිබූ වැඩවසම් ක්‍රමය අහෝසි කර, නැපෝලියානු නීති සංග්‍රහය හඳුන්වා දුනි. පොදු බදු ප්‍රතිපත්තිය 'එරට' වෙළෙඳ කටයුතු දියුණු වීමට බලපෑවේ ය. එම ප්‍රදේශ නැපෝලියන් යටතේ විදේශ ආධිපත්‍යයට ලක්වීම නිසා ඉන් මිදීමට ද ජර්මන් වැසියන්ට එක්සත් භාවය අවශ්‍ය බව පෙනී ගියේ ය.

නැපෝලියන් පරාජයෙන් පසු වියානා සම්මේලනය නැවත රටවල් හිමි පාලකයන්ට දුන් නමුත් ජර්මන් ප්‍රදේශ නැවත රාජ්‍ය 39කට බෙදන ලදී. ඔස්ට්‍රියාව හා ප්‍රෂියාව ඉන් බලවත් විය. වියානා බලවතුන් විසින් එම රාජ්‍ය 39 එක්කර ජර්මන් සංයුක්තය පිහිටුවීම ජර්මන් එක්සත් ව්‍යාපාරයේ වැදගත් අවස්ථාවකි.

ඔස්ට්‍රියාවේ චාන්සලර් ධුරය දැරූ මෙටර්නික් තම ප්‍රදේශවල ජනයාගේ නැගී ආ ලිබරල්වාදී අදහස් මර්දනය කර තබා ගැනීම ද ජර්මන් එක්සත් ව්‍යාපාරයේ දී වැදගත් විය. ඔහු "කාල්ස්බාඩ්" (Carlsbad Decrees) නම් ආඥාව ජර්මන් සංයුක්තය ලවා අනුමත කර ගැනීමෙන් පසු එම ප්‍රදේශවල ලිබරල්වාදී අදහස් මතුවීම වළක්වන ලදී. එය එක්සත් ජර්මනිය බිහිවීමේ දී වැදගත් විය. මෙටර්නික්ගේ මේ මර්දනකාරී වැඩ පිළිවෙළ නිසා ඔස්ට්‍රියාවට අවනත වීමට ජර්මන් ප්‍රදේශ අකැමැති විය.


මේ අතර සෙසු ප්‍රධාන රාජ්‍ය වූ ප්‍රෂියාව නැගී ආවේ ය. ප්‍රෂියානු ප්‍රවේණිදාස ක්‍රමය අහෝසිකර, මධ්‍යම පංතිය වැඩි වශයෙන් පාලනයට සම්බන්ධ කරගෙන, පුළුල් අධ්‍යාපනයක් ක්‍රියාත්මක කර ශක්තිමත් යුද්ධ හමුදාවක් ද ඇති කෙරිණ. ක්‍රි.ව. 1843 දී ප්‍රෂියාව මුල් කරගෙන ජර්මන් ප්‍රදේශවල සොල්වරීන් (Zoll verein) නම් තීරුබදු සංගමයත් ආරම්භ විය. මේ නිසා වෙළෙඳාම දියුණු විය. මේ තීරුබදු සංගමයට බැඳුණු රාජ්‍යයන් අතර වෙළෙඳමේ දී තීරුබදු අය නොකළ නිසා බොහෝ ජර්මන් රාජ්‍ය මේ සංගමයට බැඳුනේ ය.

ක්‍රි.ව. 1843 වන විට දකුණු ජර්මන් රාජ්‍ය අතරත් මෙවැනි බදු සංගමයක් ඇති විය. එයට අමතර ව හැනෝවර්, සැක්සන්, උතුරු ජර්මන් රාජ්‍ය අතරත් මෙවැනි බදු සංගමයක් බිහි විය. පසු ව ඒ සියල්ල සොල්වරීන් බදු සංගමය සමග ඒකාබද්ධ විය. දේශපාලන එක්සත්භාවය ආර්ථික ව්‍යාප්තියට හේතු වේ යයි සැලකීම මෙයට හේතුවයි.

ක්‍රි.ව. 1848 වර්ෂයේ ප්‍රංශයේ ඇති වූ විප්ලවය නිසා ජර්මන් ප්‍රදේශවල ද විප්ලවවල අරමුණු වූයේ ජර්මන් සංයුක්තය අවසන් කර ඒකාබද්ධ පාලනය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකසා ගැනීමත් ලිබරල්වාදී පාලනයක් ඇති කිරීමත් ය. ඔස්ට්‍රියාවේ මෙටර්නික් ඉල්ලා අස්වී ප්‍රතිසංස්කරණවලට එකඟ විය. ප්‍රෂියාවේ ද විප්ලව සාර්ථක විය.

මේ නිසා ලිබරල්වාදී එක්සත් ජර්මනිය සඳහා ජාතික සභාවක් සියලු ජර්මන් රාජ්‍යවල නියෝජිතයන් 500කගේ සහභාගිත්වයෙන් පැවති අතර එය ප්‍රැන්ක්ෆර්ට් පාර්ලිමේන්තුව නම් විය. විශ්වවිද්‍යාල මහාචාර්යවරු, නීතිවේදීහු, විනිශ්චයකරුවෝ, පූජකයෝ එහි නියෝජිතයෝ වූ හ. ඔස්ට්‍රියාව ඇතුළු ජර්මන් ප්‍රදේශ මහා ජර්මනිය (Great Germany) යනුවෙන් හැඳින්විණ. ඔස්ට්‍රියාව නැවත ප්‍රෂියාව ඇතුළත් ජර්මන් රාජ්‍යයන් (Little Germany )කුඩා ජර්මනිය ලෙස හැඳින්වූ අතර කුඩා ජර්මනිය යන සංකල්පය ප්‍රැන්ක්පර්ට් පාර්ලිමේන්තුවේ සාකච්ඡාවට බඳුන් වී නතර විය.

මේ අතර ප්‍රෂියාවේ ෆෙඩ්රික් විලියම් රජු තම හමුද මෙහෙයවා කුඩා ජර්මන් රාජ්‍ය සියතට ගැනීමට කටයුතු කළේ ය. එය ද අසාර්ථක විය. මීළඟට ඔටෝ ෆොන් බිස්මාර්ක් ප්‍රෂියාව යටතේ එක්සත් ජර්මනියක් පිහිටුවීමට කටයුතු කළේ ය. ප්‍රෂියාවේ චාන්ස්ලර් තනතුරට පත් වූ ඔහු ලිබරල්වාදීන් මර්දනය කර හමුදව ශක්තිමත් කළේ ය. ක්‍රිව. 1862 පෝලන්ත කැරැල්ල ඇති වූ විට බිස්මාර්ක් රුසියාව කෙරෙහි අනුගමනය කළ ප්‍රතිපත්තිය නිසා රුසියාව ප්‍රෂියාව සමග මිත්‍ර විය. ඩෙන්මාර්ක් ප්‍රදේශ ද යටත් කර ගත් බිස්මාර්ක් අනාගතයේ ඔස්ට්‍රියාව සමග යුද්ධයක් වුවහොත් ඔවුන්ට යුරෝපා ජාතීන්ගේ සහාය ලබා ගැනීමට නොහැකි වන ලෙස ප්‍රංශය, ඉතාලිය සමග ගිවිසුම්වලට එළඹියේ ය.




**සිතියම 11.2 - ජර්මනිය ඒකාබද්ධ කිරීම**

ක්‍රි.ව. 1866 ජුනි 14 සිට ජුලි 03 දක්වා ප්‍රෂියාව හා ඔස්ට්‍රියාව අතර ඇති වූ යුද්ධයෙන් ඔස්ට්‍රියාව පරාජයට පත් විය. එයින් පසු ජර්මන් සංයුක්තය විසුරුවා හැර නව සංයුක්ත ආණ්ඩුවක් හඳුන්වා දීම සිදු විය. මේ නව සංයුක්තයේ ප්‍රධාන ඇමතිවරයා වූයේ බිස්මාර්ක් ය. පසු ව එය උතුරු ජර්මන් පෙඩරල් සංයුක්ත රාජ්‍ය නම් විය. එහි චාන්සලර්වරයා වූයේ ද බිස්මාර්ක් ය.

ජර්මනිය එක්සත් කිරීමේ ව්‍යාපාරයේ අවසාන පියවර වූයේ බැවේරියා, වුටෙම්බර්ග්, බේඩින් යන දකුණු ජර්මන් රාජ්‍යයන් උතුරු ජර්මන් සංයුක්තියට ඈඳ ගැනීමයි. මේ අතර ප්‍රංශය සමග ඇති වූ යුද්ධයෙන් බිස්මාර්ක් ජය ගත්තේය. ක්‍රි.ව. 1871 ජනවාරි 18 වර්සායි මාලිගයේ දී උතුරු ජර්මන් සංයුක්තය හා දකුණු ජර්මන් රාජ්‍ය එක් ව ජර්මන් අධිරාජ්‍ය බිහි කළේ ය. එයින් ජර්මනිය එක්සත් කිරීමේ ව්‍යාපාරය නිම විය.

### ක්‍රියාකාරකම්

1. ජර්මනිය එක්සත් කිරීමේ ව්‍යාපාරයේ ජාතිකවාදය හා ලිබරල්වාදී අදහස් ක්‍රියාත්මක වූ ආකාරය ගැන සාකච්ඡාවක් මෙහෙයවන්න.

## සමාජවාදය සහ රුසියානු විප්ලවය

### සමාජවාදය යනු

සමාජය සතු ධන සම්පත් පිළිබඳ පොදු අයිතිය තහවුරු කරමින් සෑම පුරවැසියෙකුට ම තම කුසලතා ඉහළ නංවා ගැනීමට සමාන ඉඩ ප්‍රස්තා සහතික කරන නිෂ්පාදනයේ ඵල ප්‍රයෝජන සෑම දෙනා අතර බෙදී යන සමබර ආර්ථික දේශපාලන ක්‍රමයකි.

## අධිරාජ්‍යවාදී පාලන පසුබිම



රූපය 11.5 - බිස්මාර්ක්

රුසියාවේ මහාපීටර් රජු සහ මහා කැතරින් රැජින රුසියාව සුවිශාල භූමි භාගයකට හිමිකම් කියන රටක් බවට පත් කරන ලදී. එනිසා ම ක්‍රි.ව. 18 වන සියවස වන විට රුසියාවේ ජනගහණය වර්ධනය වූ අතර විවිධ ජාතික ආගමික සංස්කෘතික වෙනස්කම් ඇති පිරිසක් රුසියාවට උරුම විය. මේ රාජකීය දෙපලට ඒ රට පාලනය කිරීමට ක්‍රමවත් වැඩ පිළිවෙළක් තිබූ නමුත් ඔවුන්ගේ පශ්චාත්කාලීන පාලකයන්ට එවැන්නක් නොතිබුණි.

විශේෂයෙන් සාර් පාලකයෝ තම බලය වර්ධනය කර ගැනීමට ඒකාධිපතිත්වය යොදා ගත්හ. ජනතාව රදළයන්ට නතු වූ අතර රදළයන් මෙන් ම රුසියානු ඕතඩොක්ස් පල්ලිය ද යුද හමුදාවට ද සාර්වරුන්ට අවනත ආයතනයෝ වූහ. 97%ක් පමණ වූ ග්‍රාමීය ජනතාව බන්ධනයන්ගෙන් පීඩාවට පත්විය. ගොවීන්ට විවිධ සමාජ අසාධාරණයන්ට හා පීඩනයන්ට මුහුණ දීමට සිදු විය. වෙළඳාම, කර්මාන්ත, බැංකු ආදී ව්‍යාපාරවල යෙදුන අය මුදල් රැස්කරගෙන හමුද, පරිපාලන හා අධිකරණ අංශවල තනතුරු දැරීය.

මොස්කව් මුල් කරගෙන දේශීය විදේශීය වෙළඳාම හා කර්මාන්ත බිහි විය. යකඩ වානේ, රෙදිපිළි, ද්‍රව රසායනික කර්මාන්ත බිහි විය. 19 සියවස වන විට රුසියාවේ එවැනි කර්මාන්ත ශාලා 3000ක් පමණ පැවතුණි. කම්කරු පංතිය ලක්ෂ 8ක් පමණ විය. කම්කරුවන්ගේ ශ්‍රම කොල්ලය, දරිද්‍රතාව, සමාජ පීඩනය, වැනි ගැටලු ද පැවතුනි.

මහා පීටර් රජතුමාගේ දවස පටන් රුසියාවේ සමාජ ආර්ථික ප්‍රතිසංස්කරණ සිදු කරන ලදී. එහෙත් පළමුවන හා දෙවන ඇලෙක්සැන්ඩර් සාර් රජවරු සුඛෝපභෝගී ජීවිතයකට සීමාවීම සහ නිලධාරීන්ගේ පැවති ආචීර්ණකල්පිත අදහස් නිසා ඒවා ක්‍රියාත්මක කිරීමට දයක නො වූහ. එහෙත් ක්‍රි.ව. 1881 මාර්තුවේ දෙවන ඇලෙක්සැන්ඩර් සාර් රජු ප්‍රවේණිදාස විමුක්ති පණත සම්මත කිරීමෙන් කෝටියක පමණ ප්‍රවේණිදාසයන්ට යුරෝපයේ මෙන් සටනකින් තොර ව නිදහස ලැබුණි. කර්මාන්ත සඳහා නිදහස් ශ්‍රමය ලබා ගැනීමට ද මෙය ඉවහල් විය. ප්‍රවේණිදාස තත්ත්වයෙන් නිදහස ලැබූ අය ගොවිතැනට අවශ්‍ය ඉඩම් නැති නිසා කුලීකරුවන් ලෙස ග්‍රාමීය කෘෂිකර්මාන්තයේ හා නාගරික කර්මාන්තවල සේවයේ නිරත විය. රජයෙන් දුන් ඉඩම්වලට බදු අයකරන ලදී.

දෙවන ඇලෙක්සැන්ඩර් සාර් රජු අධ්‍යාපන, සෞඛ්‍යය, හා දුම්රිය මාර්ග වැනි පොදු පහසුකම් නංවාලීමට කටයුතු කළ ද ඉන් අත් වූ ප්‍රතිඵල අල්ප විය. මේ නිසා හෙතෙම ද දැඩි ඒකාධිපති පාලනයකට අවතීර්ණ විය. මේ නිසා ක්‍රි.ව. 1878 "කළු අංශය" නම් පිරිසගේ ප්‍රහාරයෙන් රජු මිය ගියේ ය.

ඉන් පසු ව බලයට පත් වූ තුන්වන ඇලෙක්සැන්ඩර් සාර් අධිරාජයා, කෲර ඒකාධිපතියෙකු විය. ප්‍රතිසංස්කරණවාදීන් ඉවත් කර උග්‍ර ප්‍රතිගාමීන් තනතුරුවලට පත් කරන ලදී. රජය විවේචනය, රැස්වීම් පැවැත්වීම, අදහස් ප්‍රකාශ කිරීම තහනම් කරන ලදි. අධ්‍යාපනික වියදම් කපා දැමුණි. අධිකරණ බලය හා ප්‍රාදේශීය පාලන බලය රජු යටතට ගෙන රදළයන්ට පවරන ලදී.

පසු ව බලයට පත් වූ පළමු වන නිකලස් (1844 - 1917) අධිරාජ්‍යයා, තව දුරටත් පීඩනය තීව්‍ර කරන ලදී. කම්කරුවෝ දැඩි පීඩනයට ලක් ව සිටියහ. රුසියාවට මුලින් ම සමාජවාදය, හඳුන්වා දුන්නේ "පෙලකානොව්" අතර "ශ්‍රම විමුක්ති කණ්ඩායම" මුල් ම මාක්ස්වාදී කණ්ඩායමයි. කම්කරු පංතිය හා විශ්වවිද්‍යාල සිසුන් අතර මෙය ඉතා ජනප්‍රිය විය. ව්ලැඩිමීර් ලෙනින් මේ කණ්ඩායමේ සාමාජිකයෙකු ලෙස කපු කර්මාන්ත කම්කරුවන්ගේ වර්ජනයට නායකත්වය දුනි. කම්කරුවන් පක්ෂයක් ලෙස සංවිධානය විය යුතු යැයි ලෙනින් පෙන්වා දුන්නේ ය. ට්‍රොට්ස්කි, මාර්ටොව් ලෙනින්ගේ අදහස නො පිළිගත්හ. ඒ පිරිස මෙන්ෂෙවික් නම් වූ අතර ලෙනින්ගේ අදහස පිළිගත් බහුතරය බොල්ෂෙවික් නම් විය.

## 1905 විප්ලවය

ක්‍රි.ව. 1900 දී පමණ යුරෝපයේ ඇති වූ කර්මාන්ත අර්බුදය රුසියාවට ද පැතිරී කර්මාන්තශාලා 3000ක් පමණ වැසී ගියේ ය. ගොවීන් කම්කරුවන් තරුණ පිරිස් අධිරාජ්‍යයට දැඩි ව විරුද්ධ විය. වර්ජන නැගී ආවේය. කළු මුහුද අසල නාවික භටයෝ ද කැරැල්ලට එක් වූහ. තුර්කිය හා ප්‍රංශය ද රුසියාව සමග අමනාප විය. ක්‍රි.ව. 1905 ජර්මන් රුසියන් යුද්ධයෙන් රුසියාව පරාජයවීම ද මහජන උද්ඝෝෂණ වැඩිවීමට හේතු විය. සාර් රජු වෙත ගිය පෙළපාලියකට වෙඩි තබන ලද අතර ට්‍රොස්කි ඇතුළු නායකයන් සිරභාරයට ගෙන කැරැල්ල මර්දනය කෙරිණ.




**සිතියම 11.3 - රුසියාවේ බල ව්‍යාප්තිය**

## ඩූමාව අසාර්ථක වීම

උද්ඝෝෂකයන් ඉල්ලා සිටි ප්‍රතිසංස්කරණවලට පිළිතුරු වශයෙන් ප්‍රථම ඩූමාව ක්‍රි.ව. 1906 දී පීටර්ස්බර්ග් නගරයේ පිහිට විය. පොරොන්දු සම්පූර්ණයෙන් ඉටු නොකළ නිසා බෝල්ෂෙවික්වරු ඉල්ලා අස්වූ හ. නැවත ක්‍රි.ව. 1907 දෙවන ඩූමා සභාව පත් වූ අතර ඔවුහු ද දිගට ම අධිරාජ්‍යයාට එරෙහි වූ හ. ක්‍රි.ව. 1912 - 1917 තෙක් වූ තුන්වන ඩූමාවේ 410 දෙනෙක් වූ නියෝජිතයන්ගෙන් 310 දෙනෙක් ම අධිරාජයාට පක්ෂ ඉඩම් හිමියෝ වූහ.

ක්‍රි.ව. 1912 - 17 දක්වා පැවති හතරවන වන ඩූමාවේ ද එසේ විය.

### සාර් පාලනය බිඳ වැටීම

ක්‍රි.ව. 1910 වන විට කම්කරු වර්ජනයක් මොස්කව්හි ආරම්භ වූ අතර ක්‍රි.ව. 1913 වන විට ලක්ෂ 12ක් පමණ වූ කම්කරුවෝ එයට එක් වූහ. පළමුවන ලෝක යුද්ධයට සාර් පාලනය සම්බන්ධ වීමෙන් අර්බුදය තව දුරටත් වර්ධනය විය. ආහාර, බෙහෙත්, හා කෘෂිකාර්මික ද්‍රව්‍ය හිඟ විය. භාණ්ඩ මිල ඉහළ ගියේ ය. ගොවි කම්කරුවන් බලයෙන් යුද පෙරමුණට යැවුණි. කාන්තාවන් කර්මාන්තශාලාවල දී වධ හිංසාවට භාජනය විය. පාන් මිල ඉහළ ගියේ ය. හමුදාවට ආහාර නැති විය. මේ නිසා හමුදාව ද කැරලි ගැසුවේය.

### 1917 මාර්තු විප්ලවය

ජනතාව පාන් ඉල්ලා වීදි බැස්සේය. කැරලි මර්දන හමුදාව ආයුධ සහිත ව පෙළපාලිකරුවන්ට එකතු විය. මේ නිසා පීටර්ස්බර්ග්වල දී සාර් පාලනයට එරෙහි ව ආයුධ සන්නද්ධ අරගලයක් ඇති විය. බෝල්ෂේවියක්වරු ගැටුමට නායකත්වය දෙමින් සෝවියට සභා නම් සභා පිහිටුවා ඒවා ඔවුන්ගේ තාවකාලික රජය යටතට පත්කර අධිරාජයාට සිහසුන අත්හැරීමට බලකළහ. 1917 මාර්තු 15 දින සාර් පාලනය අවසන් විය.

### 1917 ඔක්තෝම්බර් විප්ලවය

තාවකාලික ආණ්ඩුව තව දුරටත් යුද්ධයේ පැටලී සිටි අතර ප්‍රශ්න උග්‍ර විය. ලෙනින් හා ට්‍රොස්කි එක් ව ඉඩම්, සාමය, ජාතිය සහ පාලන සම්බන්ධ ප්‍රකාශ නිකුත් කරමින් රාජ්‍ය මර්දනයට මුහුණ දෙමින් කම්කරු අරගලවලට නායකත්වය දුන්හ. ක්‍රි.ව. 1917 ඔක්තෝම්බර් වන විට දුම්රිය, පතල්, ලෝහ, රෙදිපිළි කම්කරුවෝ ලක්ෂ 10 ඉක්මවා වර්ජනයක් ගෙන ගියහ. මේ සටන්වලට නායකත්වය දී සෝවියට් සභාවල නායකත්වය දරමින් බෝල්ෂෙවික්වරු ඉදිරියට විත් එදින ම රාත්‍රී ශිත මාලිගය වටලා කාලතුවක්කු ප්‍රාහාර එල්ල කළහ. එදින රාත්‍රියේ සෝවියට් ජාතික කොන්ග්‍රසය රැස් ව ලෙනින්ගේ මහජන කොමසාරිස් සභාවට බලය පැවරීමෙන් විප්ලවය සාර්ථක විය.

මෙසේ සිදු වූ රුසියානු විප්ලවය නිසා සමාජවාදය ප්‍රායෝගික ව ව්‍යවහාරයට පත් විය. වැඩි දෙනෙකුහට ප්‍රතිලාභ අත්වන නිෂ්පාදන සේවා ක්‍රමයක් මත පදනම් වූ ආර්ථික හා දේශපාලන රටාවක් බිහිවිය.

**ක්‍රියාකාරකම්**

**1. රුසියානු විප්ලවයට බලපෑ හේතු සාකච්ඡා කර ලියන්න.**

**අභ්‍යාස**

1. කෙටි පිළිතුරු සපයන්න
   1. ප්‍රංශ විප්ලවය මෙහෙය වූ පිරිස කවුරුන් ද?
   2. ප්‍රංශ විප්ලවයට බලපෑ හේතු 03ක් ලියන්න.
   3. ඉතාලි එක්සත් කිරීමේ ව්‍යාපාරයට බලපෑ පුද්ගලයන් තුන්දෙනෙක් නම් කරන්න.
   4. ඉතාලි එක්සත් කිරීමේ ව්‍යාපාරය යටතේ එක්සත් වූ ප්‍රදේශ 4ක් නම් කරන්න.
   5. පැරණි ජර්මන් ප්‍රදේශවල මුල දී රාජාණ්ඩු කීයක් තිබුණේ ද?
   6. ජර්මන් ප්‍රදේශවල තිබූ ප්‍රධාන රාජ්‍ය 2ක් ලියන්න.
   7. රුසියානු විප්ලවයට බලපෑ හේතු 5ක් ලියන්න.
   8. බොල්ෂේවික් හා මෙන්ෂවික්වරුන් යනු කවුද?

2. වඩාත් ගැළපෙන පිළිතුරු යා කරන්න.

| | |
|---|---|
| 01. XVI වන ලුවීරජ | 01. කාබොනාරී ව්‍යාපාරය |
| 02. III පංතියේ ප්‍රංශ පූජකයන් | 02. පීඩ්මොන්ට් රජයේ අගමැති |
| 03. ගැරිබෝල්ඩි | 03. ඔස්ට්‍රියාවේ චාන්සලර්වරයා |
| 04. ජෝසප් මැසිනි | 04. බොල්ෂෙවික් පක්ෂය |
| 05. කවුන්ට් කවුවර් | 05. ටෙනිස් පිටියේ දිවුරුම |
| 06. මෙටර්නික් | 06. ප්‍රෂියාවේ චාන්ස්ලර් පදවිය |
| 07. ලෙනින් | 07. මුලින් ම රුසියාවට සමාජවාදය හඳුන්වාදුන් අය |
| 08. බිස්මාර්ක් | 08. මාරී ඇන්ටොයිනට් රැජන |
| 09. නැපෝලියන් බොනපාර්ට් | 09. ප්‍රංශ බලය යුරෝපයට ව්‍යාප්ත කිරීම |
| 10. පෙළකානොව් | 10. රතු කමිස හමුදාව |

**සාරාංශය**

- ප්‍රංශ විප්ලවය නිසා මානවවාදී අදහස් ප්‍රචලිත වීමට ඉඩ සැලසුණි.
- ජාතිකවාදී අදහස් හේතුවෙන් ඉතාලි එක්සත් කිරීමේ ව්‍යාපාරය සාර්ථක විය.
- ලිබරල් හා ජාතිකවාදී අදහස් නිසා ජර්මන් එක්සත් කිරීමේ ව්‍යාපාරය ද සාර්ථක විය.
- සමාජවාදය ප්‍රායෝගික ව දැකගත හැකි වූයේ රුසියානු විප්ලවය ආශ්‍රයෙනි.

**වැඩිදුර කියවීම**


1. ඒ ජේ. ග්‍රාන්ට් - යුරෝපයේ ගත වූ පන්සිය වසෙහි කථාව
2. ඇල්ෆ්‍රඩ් කොබෝන් - නූතන ප්‍රංශයේ ඉතිහාසය 1
3. ජේ.ඒ.ආර්. මැරියට් - නූතන යුරෝපයේ විකාශය (1453 - 1939)
4. යුරෝපා ඉතිහාසය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව